# 5–1

## අජිත සුත්තං[1]

1036 කෙනස්සු නිවුතො ලොකො(ඉච්චා යස්මා අජිතො)
කෙනස්සු නප්පකාසති,
කිස්සාභිලෙපනං බ්‍රෑසි කිංසු තස්ස මහබ්භයං

1037 අවිජ්ජාය නිවුතො ලොකො (අජිතාති භගවා.)
වෙවිච්ඡා පමාද නප්පකාසති,
ජප්පාභිලෙපනං බ්‍රෑමි දුක්ඛමස්ස මහබ්භයං

1038 සවන්ති සබ්බධී සොතා (ඉච්චා යස්මා අජිතො)
සොතානං කිං නිවාරණං
සොතානං සංවරං බ්‍රෑහි කෙන සොතා පිථීයරෙ[2]

1039 යානි සොතානි ලොකස්මිං (අජිතාති භගවා)
සති තෙසං නිවාරණං,
සොතානං සංවරං බ්‍රෑමි පඤ්ඤායෙතෙ පිථීයරෙ[2]

1040 පඤ්ඤා චෙව සති චෙව (ඉච්චායස්මා අජිතො.)
නාමරූපඤ්ච මාරිස,
එතං මෙ පුට්ඨො පබ්‍රෑහි කත්ථෙතං උපරුජ්ඣති

1041 යමෙතං පඤ්හං අපුච්ඡි අජිත තං වදාමි තෙ,
යත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣති,
විඤ්ඤාණස්ස නිරොධෙන එත්ථෙතං උපරුජ්ඣති.

1042 යෙ ච සඞ්ඛාතධම්මාසෙ යෙ ච සෙඛා පුථූ ඉධ,
තෙසං මෙ නිපකො ඉරියං පුට්ඨො පබ්‍රෑහි මාරිස.

1043 කාමෙසු නාභිගිජ්ඣෙය්‍ය මනසානාවිලො සියා,
කුසලො සබ්බධම්මානං සතො භික්ඛු පරිබ්බජෙති.

1. අජිතසුත්තං පඨමං.[3]

---

1. අජිතමාණව පුච්ඡා – ම. ඡ. සං.
2. පිධියතරෙ – ම. ඡ. සං.
3. අජිතමාණව පුච්ඡා ම. ඡ. සං.



Free Distribution www.aathaapi.org

## 5 – 1

## අජිතමාණව පෘච්ඡා

1036. (ආයුෂ්මත් අජිත මෙසේ පිළිවිත්:) ලෝවැසි තෙම කිමෙකින් නිවෘත (වැසුනේ) ද? කවර හෙයින් නො පැණේ ද? ඔහට කිමෙක් අභිලෙපන (ලහවු) වේ'යයි වදරණසේක් ද? කිමෙක් ඔහට මහබිය නම් වේ දැ'යි.

1037. (අජිතයෙනි, යි බුදුහු වදළහ), ලොවැසි තෙම අවිද්‍යායෙන් නිවෘත යැ. මාත්සය්‍යී හෙයින් ප්‍රමාද හෙයින් ප්‍රකාශිත නො වෙයි, තෘෂ්ණාව අභිලෙපන යයි කියමි, ඔහට (ජාත්‍යාදී) දුක මහබිය වෙයි.

1038. (ආයුෂ්මත් අජිත මෙසේ පිළිවිත්:) හැම තන්හි (රූපාදි හැම ආයතනයන්හි තෘෂ්ණාදි) ස්‍රොතස්හු ගලායෙති. ස්‍රොතසුන්ගේ ආවරණය කවරැ? ස්‍රොතසුන්ගේ සංවරය වදළමැනැවි. කවර දහමෙකින් ස්‍රොතස්හු පියනු ලැබෙත් ද?

1039. අජිතයෙනි, (යි භාග්‍යවතුන් වහන්සේ වදළසේක:), ලොව යම් ස්‍රොතස් කෙනෙක් වෙත් නම්, ස්මෘතිය ඔවුන්ට ආවරණ යැ. (එ ස්මෘතිය) ස්‍රොතසුන්ගේ සංවර යයි කියමි. (මාර්ග) ප්‍රඥායෙන් තෙල ස්‍රොතස්හු පියනු ලැබෙත්.

1040. (ආයුෂ්මත් අජිත මෙසේ පිළිවිත්:) නිදුකානන් වහන්ස, ප්‍රඥාව ද සම්‍ඍතිය ද (තදවශෙෂ) නාමරූපය ද යන තෙල සියල්ල කොහි නිරුද්ධ වේ ද? මාවිසින් පුළුවුස්නාලද මුඹ වහන්සේ තෙල කරුණ මට වදළමැනව.

1041. අජිතයෙනි, තෙපි යම් පැනයක් විචාළවු ද, එය තොපට කියමි. යම් තැනෙක්හි නාමයත් රූපයත් නිරවශේෂයෙන් නිරුද්ධ වේ ද, (පශ්චිම) විඥානයාගේ නිරොධය හාමැ (පෙර පසු නැතිව) තෙල විඥාන නිරොධයෙහි මැ තෙල නාමරූපය උපරුද්ධ වෙයි. (විඥානනිරොධය ඉක්මැ නො යෙයි).

1042. නිදුකානන් වහන්ස, මෙ ලෝකයෙහි (අනිත්‍යාදි විසින්) විමසන ලද දහම් ඇති යම් (අශෛක්ෂ) කෙනෙක් වෙත් නම් යම් බොහෝ වූ ශෛක්ෂ කෙනෙකුත් වෙත් නම්, මා විසින් පුළුවුස්නා ලද සේක් (ශෛක්ෂාශෛක්ෂධර්මයෙහි) පණ්ඩිත වූ මුඹ වහන්සේ ඔවුන්ගේ ප්‍රතිපත්තිය වදළ මැනැව.

1043. කාමයෙහි ගිජු නොවන්නේ ය. සිතින් නොකැළැඹුනෙක් වන්නේ ය. මහණ සකලධර්මයන්හි කුශල වූයේ ස්මෘතිමත් වැ හැසිරෙන්නේ යැ යි.

**අජිත මාණව පෘච්ඡා නිමි.**



Free Distribution www.aathaapi.org